www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පුද්ගලික අයිතිය ආරක්ෂා කිරීම සඳහා චීන පාලන තන්ත්‍රය ව්‍යවස්ථාව සංශෝධනය කරයි

**Chinese regime amends constitution to protect private ownership**

**ජෝන් චාන් විසිනි**
**2004 අප්‍රේල් 2**

---

මාර්තු 14 දා අවසන් වූ චීන ජාතික ජනතා කොංග්‍රසයෙහි (එන්පීසී) කර්තව්‍යය මූලික වූයේ දේපල, ව්‍යාපාර හා ධනය පිලිබඳ පුද්ගලික අයිතිය නියත වසයෙන් ම ආරක්ෂා කිරීම සඳහා රටෙහි ව්‍යවස්ථාව සංශෝධනය කිරීම යි.

හිටපු ජනාධිපති ජියැං සෙමින්ගේ ''තිදෙනාගේ නියෝජනය'' යන චීන කොමියුනිස්ට් පක්ෂයට පෞද්ගලික ව්‍යවසායකයන්ට ඇතුල්වීමට ඉඩ ලැබෙන න්‍යාය ද රජයේ ''මෙහෙයුම් මූලධර්ම'' වලට එකතු කරන ලද්දේ මාඕ සේතුංගේ චින්තනය මෙන් ම ඩෙංෂියා ඕ පිංගේ න්‍යාය ද සමග එකතු කරමිනි.

සංශෝධන කෙටුම්පත් කරන ලද්දේ ජනාධිපති හූ ජින්ටාවෝ හා අගමැති වෙන් ජියාබාවෝගේ නායකත්වයෙන් යුත් නව සීසීපී මධ්‍යම කාරක සභාව විසිනි. ප්‍රධාන වසයෙන් තෝරා ගත් ව්‍යාපාරිකයන්, රජයේ නිලධාරීන් හා වෘත්තිකයින්ගෙන් සමන්විත වූ 3000ක එන්පීසී නියෝජිත පිරිස එම සංශෝධන එක ඡන්දයෙන් සම්මත කලහ.

පසු ගිය වසර 25 තුල බීජිංහි නිදහස් වෙලඳාමේ න්‍යාය පත්‍රය විසින් බිහි කරන ලද නව ධනේශ්වර පන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලව චීන ස්ටැලින්වාදී රාජ්‍ය සංස්ථාපිතය යලි හැඩගැස්වීම මේ ව්‍යවස්ථා සංශෝධන මගින් කර ගෙන යනු ඇත.

වෙලඳ පොල ප්‍රතිසංස්කරන දියත් කිරීමෙන් තෙවසරකට පසුව, 1982 වසරේ දී පුද්ගලික අංශය රජය සතු ආර්ථිකයට ''අනුපූරකයක්'' ලෙස පිලිගැනීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කරන ලදි. 1993 දී ''වෙලඳ පොල ආර්ථිකය'' නමැති ප්‍රවර්ගය එක් කරන ලදි. 1999 දී, චීන ආර්ථිකයෙහි ''සාරභූත කොටසක්'' ලෙස පුද්ගලික ව්‍යවසායන් නගාසිටුවන ලදි.

මේ දින වකවානු පිලිබඳව රාජ්‍ය මාධ්‍ය පවා හඳුන්වන්නේ යලි නො හැරවිය හැකි ''පුද්ගලිකකරන මාර්ග සිතියමක්'' ලෙස ය. 2003 වසර අවසන් වන විට, පුද්ගලික ව්‍යවසායන් සංඛ්‍යාව මිලියන 2.97ක් දක්වා ඉහල නැග තිබුනු අතර ඒවායේ මුලු ප්‍රාග්ධන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 40.5ක් විය. දැන් චීනයෙහි වාර්ෂික ආර්ථික වර්ධනයෙන් අඩකට වගකියන්නේ පුද්ගලික අංශය ය.

මෑත වෙනස්කම්, රාජ්‍ය ආරක්ෂාව පිලිබඳ ස්ථිර සහතිකයන් ලෙස චීන මෙන් ම ජාත්‍යන්තර ව්‍යාපාරිකයින් විසින් ද අගය කර ඇත. පුද්ගලික දේපල පිලිබඳව කලින් කර තිබූ, ව්‍යවස්ථාපිත සඳහන් කිරීම්, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය සුරැකීම වැඩ නො කරලවන ආදායම් හා බුද්ධිමය දේපල අයිතීන්ට නිසැක රැකවරනයක් ලැබී නො තිබුනි.

''සිය වත්කම්වල ආරක්ෂාව පිලිබඳව ව්‍යවසායකයින් තුල ඇති සැඟවුනු කනස්සල්ල'' ඉවත් කර දිගුකාලීන ආයෝජන පිලිබඳ සිය විශ්වාසය ඉහල නැංවීමට මේ සංශෝධන හේතුකාරක වනු ඇතැයි සමස්ත චීන කර්මාන්ත හා වෙලඳ සමිති සම්මේලනයෙහි අධ්‍යක්ෂ වැං හයිබින් *සින්හුවා* පුවත් ඒජන්සියට පැවසී ය. චීනයේ මින්ෂෙං පෞද්ගලික බැංකු සංගමයෙහි නිර්මාතෘ ලියු යොංහාවෝ මෙසේ ප්‍රකාශ කලේ ය: ''සිය පුද්ගලික වත්කම් සඳහා නෛතික ආරක්ෂාව ලබා දෙන ලෙස පුද්ගලික ව්‍යවසායකයන් වසර ගනනක් තිස්සේ ඉල්ලා සිටියහ.'' මෙය, අප වඩාත් විශ්වාසවන්තව හා අනාගතය පිලිබඳ ශුභවාදීව කටයුතු කිරීමට හේතුවනු ඇත.

බීජිංහි බටහිර රටක විදේශ සේවා නිලධාරියෙක් රොයිටර් වෙත මෙසේ පැවසීය: ''පුද්ගලික දේපල පොදු අයිතිය සේ ම නීතියුක්ත යයි පැවසීමට ඔවුන් තීරනය කිරීම වැදගත් වේ. එය, සූරාකෑම යහපත් යයි පිලිගැනීමේ මගකි. එය දැවැන්ත ඉදිරි පියවරකි.''

### ස්ටැලින්වාදයේ තර්කනය

මේ ව්‍යවස්ථාපිත වෙනස් කිරීම්, විශාල සංකල්පමය ඉදිරි පිම්මක් සලකුනු කරමින් චීන පාලන තන්ත්‍රය තවදුරටත් ''කොමියුනිස්ට්'' නො වන බව සංඥා කරන බවට ජාත්‍යන්තරව කතුවැකි විවරන තුලින් අර්ථ නිරූපනය වී ඇත.

නිදසුනක් වසයෙන් දකුනු චීන *මෝනිං පෝස්ට්* පුවත් පත මාර්තු 8 දා මෙසේ සටහන් කලේ ය: ''මේ මාසයේ දී ජාතික ජනතා කොංග්‍රසය පුද්ගලික දේපල ආරක්ෂා කිරීම පිලිගන්නා ව්‍යවස්ථාපිත සංශෝධනයක් අනුමත කරනු ඇත. එම තීරනය මූලික මාක්ස්වාදී මූලධර්ම හා න්‍යායන්ට ප්‍රතිවිරුද්ධව යන්නකි. මෙහි අරුත වන්නේ චීන කොමියුනිස්ට් පක්ෂය තම ඓතිහාසික නාමය තවදුරටත් දරා සිටින අතර එය මුලුමනින් ම වෙනස් වූ උරුමයක් පිලිගන්නා බවකි.

''එක් අර්ථ නිරූපනයක් වන්නේ චීනය තවදුරටත් කොමියුනිස්ට් රටක් නො වන බව ය. තවෙකක්

වන්නේ, එකිනෙකා සමග තරගයෙහි යෙදෙන අවශ්‍යතාවන් හා ප්‍රාදේශීය කන්ඩායම් ගනනාවක් තිබිය දී වුව, සංස්ථාගත චීනය ඒකපාක්ෂික ක්‍රමයක් පවත්වාගෙන යන, ලොව සීඝ්‍රයෙන් ම වර්ධනය වන ධනේශ්වර ආර්ථිකය බවට පත්ව ඇති බව ය.

එසේ වුව ද, මෑත ම පියවර යන්ගෙන් ප්‍රකාශිත වන්නේ ''කොමියුනිස්ට්වාදයෙන්'' ආපසු හැරීමක් නො ව, චීන ස්ටාලින්වාදයෙහි තර්කානුකූල ප්‍රතිඵලය යි.

1949 වසරෙහි දී මාඕ සේතුංගේ නායකත්වයෙන් යුතු ගොවි ව්‍යාපාරයක් මත පදනම් ව බලයට පැමිනි 1949 චීන විප්ලවය කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන් වූ අව්‍යාජ කම්කරු ප්‍රජාතන්ත්‍රවාදයේ පාලනයක් නො වේ. මාඕ ගෙන ගිය ක්‍රියාමාර්ගය ''පන්ති හතරක එකමුතුවක්'' එනම් චීන ධනේශ්වර පන්තියේ හා ගම්බද ගොවි කොටස් සමග ගොඩනැගූ සන්ධානයකි. එන්සීපීය ස්ථාපිත කිරීමෙහි ම අරමුන වූයේ සීසීපී සමග එකතු වී කටයුතු කිරීමට සූදානම් වූ චීන ධනපතියන්ට නව තන්ත්‍රය තුල තැනක් තිබෙනු ඇති බවට යලි තහවුරු කිරීම ය.

සත්‍ය වසයෙන් ම මාඕවාදී ප්‍රතිපත්තිය වූයේ ''චීන සමාජවාදය'' නියෝජනය කරනවා යයි ප්‍රකාශ කරන අතර ම, ජාතික ආඥාදායකත්වයක් ගොඩනැගීම ය. එය උත්සුක වූයේ නිලධාරි තන්ත්‍රය තුලින් වැඩී ආ සැලසුම් හා නිෂ්පාදන සලාක මත බෙහෙවින් පසුගාමී හා විශාල ගොවි ආර්ථිකයක සෑම අංගයක් ම පාහේ සංවිධානය කිරීමට ය.

දරුනු ආර්ථික අර්බුදයක් ද, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ වැටලෑමක් ද චීන ධනපතීන් වැඩිදෙනා තායිවානය හා හොංකොං වෙත පලායාම ද හේතු කොට ගෙන කර්මාන්ත බොහොමයක් ජනසතු කිරීමට සීසීපීයට බල කෙරින. 1950 ගනන්වල පැතිරුනු ගොවිබිම් සාමූහිකරනයට දුවවනු ලැබුවේ කාර්මිකකරනය සඳහා ආදායම් උපයා ගැනීමට මෙන් ම හා නිලධරයට ගොවි ජනතාව අතර සහයෝගය පවත්වා ගෙන යෑමට ඇති අවශ්‍යතාවය මගිනි.

1960 ගනන්වල හා 1970 දශකයෙහි මුල් වසර තුල ඇති වූ සංස්කෘතික විප්ලවයෙහි අවසානය - මෙය මාඕගේ පාලන බලය ශක්තිමත් කර ගැනීම අරමුනු කොට ගත් ප්‍රතිගාමී ව්‍යාපාරයක් විය - හුදෙකලා වූ ආර්ථිකය එක තැන පල්වෙමින් ද කඩා වැටීමක් කරා ඇදීයමින් ද තිබුනි. 1973 දී එක්සත් ජනපදය සමග සබඳතා යලි පිහිටුවා ගැනීමත් සමග නිදහස් වෙලඳ පොලක් වෙත හැරීමට පූර්ව කොන්දේසි මාඕ විසින් ම නිර්මානය කලේ ය.

1976 වසරෙහි මාඕගේ මරනයෙන් අනතුරුව, ඩෙංෂියා ඕ පිං වටා වූ කල්ලියක් බලය අල්ලා ගත්තේ ය. ඩෙං යටතේ ආර්ථික ප්‍රතිපත්තිය විවෘතව ම හැඩගස්වන ලද්දේ දකුනු කොරියාවෙහි හා තායිවානයෙහි අත්දැකීම් මත ය. අන්තර්ජාතික සංගත සඳහා වූ නිමැවුම් වේදිකා බවට පත් වූ එම රටවල ලාභ ශ්‍රමය හා කම්කරු පන්තිය මත පනවන ලද දැඩි මිලිටරි පාලනය යන කරුනු දෙක මේ සමාගම් තම වාසියට සලසා ගත්හ. භූගෝලීය ආයෝජනයන්ගෙන් කොටසක් තමන් වෙත ආකර්ෂනය කර ගැනීමේ අරමුන ඇතිව, 1978 වසරේ දී චීනය සිය ප්‍රථම නිදහස් වෙලඳ කලාප පිහිටුවී ය.

ඉන්පසු දශක කිහිපය තුල, විශේෂයෙන් ම චීනයට දැවැන්ත ආයෝජන ගලා ආ 1990 දශකය තුල තමන් නව දේපල අයිතිකාර ධනේශ්වර ප්‍රභූත්වයක් බවට පරිවර්තනය වීමට සීසීපී නිලධාරීන්ගේ පවුල් සිය දේශපාලන බලය හා විදේශීය ප්‍රාග්ධනය සමග සබඳකම් උපයෝගි කර ගත්හ. කම්කරු පන්තිය රුදුරු ලෙස සූරාකෑමෙහි දී සීසීපීයට සම්බන්ධ ව්‍යවසායකයින්, විධායක නිලධාරීන්, රාජ්‍ය නො වන සංවිධාන තුලින් ක්‍රියාත්මක වන කොටස්, කොන්ත්‍රාත්කරුවන්, ආනයන හා අපනයන වෙලඳාමෙහි යෙදෙන්නවුන් හා වෘත්තිකයන් ප්‍රධාන අන්තර් ජාතික සංගතවල කනිෂ්ඨ හවුල්කරුවන් බවට පරිවර්තනය වී ඇත.

## නායකත්වයෙහි හතර වන පරම්පරාව

මෙම සමාජ ස්ථරයේ අවශ්‍යතාවන් එන්පීසීයේ විධාන මගින් ප්‍රකාශ වුනි. එසේ වුව ද, පසුගිය 25 වසර තුල ගොඩනැගුනු දැවැන්ත විසංවාදයන් ගැන තමන් සවිඥානක වන බව බීජිංහි තන්ත්‍රය පෙන්නුම් කර ඇත. සුලුතරයක් ධනය රැස්කල අතර ජනගහනයෙන් බහුතරයට අනාරක්ෂිත බව හා දුෂ්කරතා ද විඳදරා ගැනීමට සිදු වී ඇත. සමානාත්මතාවය නියෝජනය කිරීම පිලිබඳව සීසීපීයේ කියාපෑම්වලට යටින් වලකැපී ඇත.

අන්ත අසමානතාවන්, විප්ලවයක් පිලිසිඳගැනීමට ''හේතුවන'' බව ''ඉතිහාසය තුලින් චීන පාලන තන්ත්‍රය උගත යුතු බව පෙබරවාරි 29 වැනි දින *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත පවා අනතුරු ඇඟවී ය.

*නිව් යෝක් ටයිම්ස්* පුවත් පත මෙසේ ලිවී ය: ''සමාජ විද්‍යාඥයින් විසින් රටක ආදායම බෙදීයාමෙහි විෂමතාවය විනිශ්චය කරන මෑත ම මිනුම් දන්ඩ පෙන්නුම් කරනුයේ, උදාහරනයක් වසයෙන්, එක්සත් ජනපදයට, ජපානයට, දකුනු කොරියාවට හා ඉන්දියාවට වඩා චීනය අසමානතාවයෙන් වැඩි බව ය. ඇත්ත වසයෙන් ම, 1940 ගනන්වල කොමියුනිස්ට්වාදීන් දුගීන්ගේ ද සහායෙන් ජාතිකවාදී ආන්ඩුව පෙරලා දැමූ අවධියේ එහි පැවති මට්ටම් කරා වර්තමාන චීනය ගමන් කර තිබේ.''

පාලන තන්ත්‍රයෙහි විශ්වාසනීයත්වය නැංවීම සඳහා හූ හා වෙන් ඇතුලු නව නායකත්වය පුලුල් ජනතාවාදී පියවර මාලාවක් මගින් එයට ලිබරල් හා ප්‍රජාතන්ත්‍රවාදී මුහුනුවරක් දීමට වැර දරති. මේ සන්දර්භය තුල, ව්‍යවස්ථාවේ 33 වගන්තියට ''මානව අයිතීන්'' පිලිබඳ සහතිකයක් එක්කර තිබේ.

චීන පොදු ජනතාව ගැන ආදරයක් ඇති බව පෙන්වීමට නායකයන් දෙදෙනාම දුප්පත් ගොවි නිවෙස්වල නව වසරට පෙර දින ගත කලහ. පසු ගිය වසර තුල ඔවුන් දෙදෙන පෙර නුදුටු ආකාරයෙන්

පතල්කරුවන්, එච්අයිවී රෝගීන් හා ''වරප්‍රසාද නො ලත්'' අනිකුත් කොටස්වල සුවදුක් විමසීමේ ගමන්වල යෙදුනහ.

ආන්ඩුව දූෂිත හා නිලධාරිවාදී එකක් බවට පුලුල් ලෙස පැතිර ඇති හැඟීම ලිහිල් කිරීමට වෙනත් ප්‍රයත්නයන් ද දරා ඇත. බෙයිඩාහේහි පිහිටි ග්‍රීෂ්ම මාලිගාවෙහි වාර්ෂිකව පවත්වන සම්ප්‍රදායික වුව රහස්‍ය වූ රැස්වීමක් අවලංගු කර ඇත. දේශපාලන කමිටුවේ රැස්වීම් හා න්‍යාය පත්‍රවල පිටපත් මහජනයා අතට පත්කොට ඇත. සිය නව නායකත්වය ''විවෘතව'' හා ''අවංකව'' කටයුතු කරන බව ද ඊට සහාය දක්වන බවට ද රජයේ නිලධාරීන් හා රාජ්‍ය පාලනය යටතේ පවතින ජනමාධ්‍ය යොදාගනියි. පසු ගිය වසරෙහි ඇති වූ සාර්ස් වසංගතය හ්‍යූ එලෙස ප්‍රයෝජනයට ගත්තේ ය.

1989 වසරේ මැයි-ජූනි මාසවල තියනන්මෙන් චතුරශ්‍රයෙහි පැවති විරෝධතා ''ප්‍රතිවිප්ලවවාදී'' බවට සීසීපිය විසින් අපවාදයට ලක් කිරීම යලි පිරික්සිය යුතු බවට එන්පීසීය වෙත ලිපියක් පවා ඉදිරිපත් කෙරින. චීනයෙහි සාර්ස් වසංගතය පසු ගිය මාර්තු මාසයේ දී ප්‍රථමයෙන් ම එලිදරව් කල හිටපු යුදහමුදා ශල්‍ය වෛද්‍ය ජියැං යැංයොං විසින් සකසන ලද මෙම ලිපිය එන්පීසී ස්ථාවර කමිටුව වෙත හා සීසීපී මධ්‍යම කමිටුව වෙත යවන ලදි.

එන්පීසීයට ඉදිරිපත් කරන ලද අගමැති වෙන් ජිආබාවෝගේ වාර්තාව හා අයවැය ලේඛනය නව නායකත්වයෙහි ''ප්‍රතිසංස්කරනවාදී'' මවාපෑම දිගට ම නවත්වාගත්තේ ය. කලින් වාර්තාවල යොදාගත් භාෂාවට වඩා වෙනස් වූ භාෂාවකින් සිය ආන්ඩුවේ ප්‍රතිපත්තීන් ''ජනතාව පලමුවෙන්'' ''තුලනාත්මක'' ආර්ථික ප්‍රතිව්‍යුහකරනයක් දිගුකාලීන මූලෝපායාත්මක ''සමාජ සංවර්ධනය'' යනාදී වසයෙන් වෙස්ගැන්වී ය. එහි මුල් වචන භාවිතය නිතරම හැඳින්වූයේ ''ප්‍රභූත්වය'' හා ආර්ථික වර්ධනය - සමාජ ගැටලුවලට ඉහලින් තබන්නේ ය යන චෝදනා ද සමග ය.

පසු ගිය වසරේ චීනයෙහි ඒක පුද්ගල ආදායම් ඇමරිකානු ඩොලර් 1000කට නැග තිබේ. වෙන්ගේ වාර්තාව කේන්ද්‍රගත වූයේ පහත වැටෙමින් පවතින ග්‍රාමීය ආදායම් හා දුප්පතුන් හා පොහොසතුන් අතර පරතරය වැනි වර්ධනය වන සමාජ අසමානතාවයට අදාල අංග පිලිබඳව ය.

චීන ආර්ථිකය තීරනාත්මක සන්ධිස්ථානයකට එලඹ ඇතැයි මාර්තු 14 වැනි දින පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවක දී වෙන් ප්‍රකාශ කලේ ය. ''වසර කිහිපයක් තුල මුල් බැස ඇති ගැටලු හා අසමතුලනයන් මූලික වසයෙන් නො විසඳී ඇත. අප මේ තත්වය හොඳින් පාලනය කර ගැනීමට අපොහොසත් වුවහොත් ආර්ථිකය පසුබෑමට ලක්වීම වැලැක්විය නො හැක.''

පසුගිය වසර තුල ආර්ථික වර්ධනය සියයට 9.1ක් වුව ද නිල සේවා වියුක්ති අනුපාතිකය සියයට 4.3ක සිට සියයට 4.7ක් දක්වා වැඩි විය. ආන්ඩුවේ අමාත්‍යවරයෙකු වන සෙං සිලින් එන්පීසී පුවත් පත් සාකච්ඡාවක දී දැනට පවතින සේවා වියුක්ති මට්ටම එසේ ම පවත්වා ගෙන යෑම සඳහා යටත් පිරිසෙයින් නව රැකියා දස ලක්ෂ 9ක් නිර්මානය කිරීමට අවශ්‍ය වන අතර රැකියා සොයායන්නන් දස ලක්ෂ 24ක් ශ්‍රම බලකායට එකතුවීම අපේක්ෂා කරන බව මාර්තු 9 දා ප්‍රකාශ කලේ ය.

''මා කම්කරු අමාත්‍යාංශයට හා සමාජ ආරක්ෂනයට සම්බන්ධ වූයේ දැනට අවුරුද්දකට උඩදී ය. ඊට පෙරාතුව මගේ වගකීම වූයේ රාජ්‍ය ව්‍යවසායන් වසා දැමීම ය. මේ රැකියාවට මා මාරු කරන්නට යන බව කලින් දැනසිටියේ නම්, සමාගම් වසා දැමීම සම්බන්ධයෙන් මා එතරම් උනන්දු නො වනු ඇතැ'' යි ඔහු ප්‍රකාශ කලේ ය.

පසු ගිය වසර තුල, ග්‍රාමීය ප්‍රදේශවල ආදායම් වැඩි වූයේ සියයට 4.3ක ප්‍රතිශතයකින් පමනි. මෙය 2002 වසර තුල ආදායම් වැඩිවීමේ ප්‍රතිශතය වූ 4.8කට වඩා අඩු මට්ටමකි. දැන් චීනයෙහි නගරවල වෙසෙන්නෝ එහි ගම්වල වෙසෙන්නන් දසලක්ෂ 900ට වඩා 3.2 ගුනයක ආදායම් උපයති - මෙය දරිද්‍රතාවයෙන් පෙලෙන සිම්බාබ්වේහි තත්වයට වඩා සුලුවෙන් වැඩි අංකයකි. චීන දුප්පත්කමට සහන සැලසීමේ අරමුදලට අනුව, දසලක්ෂ 30ක ග්‍රාමීය ජනතාවට ප්‍රමානවත් ආහාර හා ඇඳුම් පැලඳුම් නොමැත. තවත් දශලක්ෂ 60ක් වාර්ෂිකව උපයන ආදායම ඇමරිකානු ඩොලර් 100කට අඩු ය. අනිත් අන්තයෙහි, රටෙහි ධනවත්ම පුද්ගලයින් 400 දෙනා සංයුක්තව උපයන ආදායම යුවාන් බිලියන 301.1කි (එනම්, ඇමරිකානු ඩොලර් බිලියන 36කි.)

ග්‍රාමීය පෙදෙස්වල ස්ථාවරත්වය පවත්වා ගෙන යෑම සඳහා ග්‍රාමීය ශ්‍රම බලකායට සහාය වීමට වාර්තාගත යුවාන් බිලියන 150ක් වැය කරනු ඇතැ යි වෙන් නිවේදනය කලේ ය. මෙයට සේවා වියුක්ති ග්‍රාමීය තරුනයින් සඳහා පුහුනු කිරීමේ වැඩපිලිවෙල හා බදු අඩු කිරීම් ද ඇතුලත් වේ. රජය සතු ව්‍යවසායන්වල සේවයෙන් ඉවත දමන ලද කම්කරුවන් සඳහා සීමිත සමාජ ආරක්ෂන වැඩපිලිවෙලක් වෙනුවෙන් යුවාන් බිලියන 77.9ක් වැය කිරීම ද ඔහු නිවේදනය කලේ ය. සමාගම් බොහොමයක් වසා දමා ඇති උතුරුකර පලාත්වලට මේ මුදල යොමු කෙරෙනු අත.

සමස්තයක් වසයෙන්, යුවාන් ට්‍රිලියන 2.68ක අයවැය ලේඛනයක් වෙන් නිවේදනය කලේ ය. මෙය පසු ගිය වසරට වඩා සියයට 8.8කින් වැඩිවීමකි. මෙයට අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා වැඩිපුර වැඩි කිරීම් ද ඇතුලත් වේ. මේ අයවැය ලේඛනයෙහි අරුත වන්නේ දැනට දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30ක ප්‍රතිශතයක රාජ්‍ය නය බරක් පෙන්නුම් කරන චීනය තවදුරටත් නය වන බව ය. සමාජ නොසන්සුන්තාවය මැඩපැවැත්වීම හා නව නායකත්වය පිලිබඳ මිථ්‍යාවන් වර්ධනය කිරීම සඳහා සුබසාධන සම්බන්ධයෙන් මුදල් වැය කිරීම අත්‍යවශ්‍ය යයි පාලන තන්ත්‍රය පැහැදිලිව දැකගෙන තිබේ.

## "ප්‍රතිසංස්කරනයට" ඇති සීමාවන්

දේශපාලන හා ආර්ථික ''ප්‍රතිසංස්කරනයන්'' සැලකිලිමත්ව කලමනාකරනය කරනු ලැබේ. දේශපාලනයෙහි සෘජුව මැදිහත්වන ලෙස පොදු ජනතාව වෙත කෙරෙන ඉල්ලීම් - මේවා සීසීපීයේ ආඥාදායකත්වයට අභියෝගාත්මක වනු ඇත - තවදුරටත් තහනම්ව පවතී. *වොෂින්ටන් පෝස්ට්* පුවත් පතෙහි මාර්තු 14 වැනි දින පලවූ වාර්තාවකට අනුව, චීන නායකත්වය විසින් ''බටහිර දේශපාලන පද්ධතියක උපාංග'' යොදාගැනීම, බලය මත ඔවුන්ගේ ග්‍රහනය පවත්වාගැනීම සඳහා සිතාමතා සැලසුම් කරන ලද්දකි.

*වොෂින්ටන් පෝස්ට්* පුවත් පත මෙසේ සටහන් කලේ ය: ''ඇත්තට ම, අභ්‍යන්තර සාකච්ඡාවලට සහභාගි වූ පක්ෂයේ නිලධාරීන්ට හා උගතුන්ට අනුව, හියූ හා ඔහුගේ සහකරුවෝ චීනයට ගැලපෙන නව දේශපාලන ආකෘතියක් සොයමින් සිටිති. අතිවිශාල ජනගහනයකට හා දේශපාලන කැලඹීම්වල ඉතිහාසයකට උරුමකම් කියන මේ රට බහුපාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය නො වන බව ඔවුහු තර්ක කරති. එනමුදු, චීනයෙහි වර්තමාන පද්ධතිය දූෂනයෙන් ආබාධිත වී ඇති බවටත් වැඩෙන සමාජ අසහනය කලමනාකරනය කිරීමට හෝ වර්ධනය සහතික කිරීමට අවශ්‍ය වන ආර්ථික ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කිරීමට හෝ වඩ වඩාත් අපොහොසත් වන බවටත් ඔවුහු නිගමනය කර ඇති බවක් පෙනී යයි.

එන්පීසීයට පෙරාතුව, ජනමාධ්‍ය හා බුද්ධිමතුන් මෙන් ම අන්තර් ජාලය මත ද, බීජිං තන්ත්‍රය සිය පාලනය දැඩි කලේ ය. කම්කරුවන් හා ගොවීන්ගේ විරෝධතා සම්බන්ධයෙන් දැඩි ලෙස ක්‍රියා කිරීම පොලිසිය නවතා නැත. විශ්වවිද්‍යාල දේශන අධීක්ෂනය කරන ලෙස රාජ්‍ය ආරක්ෂක අංශවලට නියෝග කොට ඇත. විදේශීය ග්‍රන්ථවල චීන භාෂා පරිවර්තන පලකිරීම අධෛර්යමත් කෙරේ.

නිදසුනක් වසයෙන් ගොවියාගේ දුක්ගැනවිලි පිලිබඳ ස්වාධීන පුවත් පත් ගවේෂනයක් වූ මෑත දී වඩාත් ම හොඳ අලෙවියක් ලද *චීන ගොවි ජනතාව පිලිබඳ ගවේෂනාත්මක වාර්තාව* නමැති කෘතිය එන්පීසීය පැවැත්වීමට ආසන්න දිනක සීසීපීයේ මධ්‍යම කාරක ප්‍රචාරක දෙපාර්තමේන්තුව විසින් අපලේඛනය කරන ලදි. ඒ එම කෘතිය වැඩිදුර සාකච්ඡාව සඳහා දේශපාලනික වසයෙන් සංවේදී වේ ය යන පදනම මත ය.

මේ කෙරීගෙන යන සමාජ පාලනය ජියැං සෙමින්ගේ - ඔහු දැනට මධ්‍යම මිලිටරි කොමිෂන් සභාවේ සභාපති ධූරය දරයි - තවදුරටත් ඉතිරිව පවතින බලපෑම ලෙස ඇතැම් බටහිර විචාරකයින් අර්ථකථනය කල ද, කම්කරු පන්තිය මේ තන්ත්‍රයට අභියෝග කල හොත් කලින් පැවති පරම්පරාවෙහි නායකත්වය මෙන් ම නව නායකයින් ද කුරිරු මර්දනය දියත් කිරීමට සූදානම් ය.

1989 මැදභාගයෙහි දී ඇති වුනු ආන්ඩු-විරෝධී කැලඹිලි තමන් විසින් බලෙන් මැඩපැවැත්විය යුතුව තිබූ ඉතා ''බරපතල දේශපාලන කැලඹිල්ලක්'' ලෙස නව නායකත්වය දැනුදු සලකන බව එන්පීසීයට අනතුරුව පැවති පුවත් පත් සාකච්ඡාවක දී වෙන් ජියාබාවෝ අවධාරනය කලේ ය. 1989 ජූනි 4 වැනි දින තියනන්මෙන් චතුරස්‍රයෙහි සිදු කල සමූලඝාතනයට අනතුරුව, සමාජ පර්යාය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඩෙං ෂියා ඕ පිංට ප්‍රසිද්ධියේ ප්‍රසාදය පල කල ප්‍රථම සීසීපී නායකයා වූයේ හූ ජින්ටාවෝ ය.

ජනගහනය මත ආඥාදායක ග්‍රහනය පවත්වාගෙන යෑමේ අධිෂ්ඨානය පසුපස ඇත්තේ නව ''බරපතල දේශපාලන කැලඹිලි'' වලක්වාලීමට බීජිං තන්ත්‍රය දරන්නා වූ ප්‍රයත්නයන් අසාර්ථකවීමට ඉඩ ඇති බවට එය තුල ඇති බිය යි. වඩාත් පුලුල් වූ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයක් පවා සිදු කරන ලෙස ඉල්ලමින් ජාත්‍යන්තර සමාගම් මගින් ඇති කරන පීඩනයට චීන ආන්ඩුව මුහුන පා සිටී.

''බීජිං තන්ත්‍රය ආර්ථික ගැටලුවලට මුහුන දී සිටින අතර ආර්ථික වර්ධනය හා විදේශීය ආයෝජන අඛන්ඩව ගලාඒම සහතික කරනු වස් ''අවදානම් වූ නමුදු අවශ්‍ය වූ පියවර මාලාවක් ගැනීම සලකා බැලීමට'' එයට බල කෙරෙනු ඇති බවට, උදාහරනයක් වසයෙන් බ්‍රිතාන්‍ය පදනම් කර ගත් *ඉකොනොමිස්ට්* සඟරාව, මාර්තු 20 වැනි දා ලිවී ය.

''රජය සතු ව්‍යවසායන් සැබෑ පුද්ගලීකරනයන්ට ලක්කිරීමේ ප්‍රතිඵලය වනුයේ ඉන් බොහොමයක කම්කරුවන් ඉවත ලෑම වුව ද, එය අත්‍යවශ්‍ය ක්‍රියාවකි. පුද්ගලික ව්‍යාපාරවලට වර්ධනය වීමට නිදහස ලබාදෙන්නේ නම්, රාජ්‍ය අංශයෙහි අහෝසි වන රැකියාවලට සරිලන පරිදි නව රැකියා සැපයීමට හැකි වනු ඇත. නිලධාරිවාදී නීතිරීතිවලට අනවශ්‍ය ලෙස හිරවීමෙහි හා දූෂනයෙහි පැටලැවෙන චීනයෙහි අතිවිශාල නිලධාරි තන්ත්‍රය සුමට හැඩගැස්වීමකට ලක් කිරීම ය මින් අදහස් කෙරෙන්නේ. ආසියාව තුල ඉහල ම තත්වයක පවතින ව්‍යාපාරික හා පුද්ගලික බදු අනුපාතිකයන් ක්‍රම-ක්‍රමයෙන් අඩු කිරීම තුලින් සමාගම් වර්ධනය වීමට ඉඩ සැලසෙනු ඇතැ''යි එම සඟරාව අවධාරනය කලේ ය.

අසහනය නැඟී ඒම මැඩපැවැත්වීම සඳහා එම තන්ත්‍රය ගන්නා සීමිත ප්‍රයත්නයන්ට සෘජුව ම පරස්පර විරෝධීව, වැඩිදුර ප්‍රතිව්‍යුහකරනය සඳහා වෙලඳ පොලෙහි ඉල්ලුම, පන්ති ආතතීන් බිඳවැටීමට ආසන්න තත්වයක් කරා මෙහෙයවනු ඇත.

© www.wsws.org